ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2356/15 - 2023 නොවැම්බර් මස 01 වැනි බදාදා - 2023.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

නිවේදනය

ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ද, ආදායම් මත බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර, 2023 පෙබරවාරි 03 වන දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ද්විපාර්ශවීය ගිවිසුම 2023 මැයි 25 දින සම්මත කර ගන්නා ලද යෝජනාව මඟින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. මහින්ද සිරිවර්ධන,
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ 01.
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ
චෙක් ජනරජයේ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන්
ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ
බදු නොගෙවා මගහැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව;

ආර්ථික සම්බන්ධතා තව දුරටත් වර්ධනය කිරීමේ සහ බදු කටයුතුවල සහයෝගීතාවය වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් යුතුව,

බදු පැහැර හැරීම හෝ වැළැක්වීම හරහා බදුකරණය නොකිරීමට හෝ බදුකරණය අඩු කිරීමට අවස්ථා (මෙම ගිවිසුමෙන් සපයා ඇති සහන, තුන්වන රාජ්‍යයේ වාසිකයන් හට වක්‍ර ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙන් සහිත සම්මුති සොයායෑමේ සැකසුම් ද ඇතුළුව), නොසලසමින් ආදායම මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ අදහසින් ගිවිසුමකට

මතු දැක්වෙන පරිදි එකඟ වී ඇතः

1 වැනි වගන්තිය
ආවරණය වන තැනැත්තන්

ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහි ම වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාල විය යුතුය.

2 වැනි වගන්තිය
ආවරණය වන බදු

1. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලනික උප කොට්ඨාසයක් හෝ එහි පළාත් පාලන අධිකාරියන් වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත වන බදු සම්බන්ධයෙන්, එය අය කෙරෙන ආකාරය පිළිබඳව නොසලකා මෙම ගිවිසුම අදාල විය යුතුය.

2. චංචල හෝ නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ මත වන බදු, ව්‍යවසායන් විසින් ගෙවනු ලබන මුළු වේතන සහ වැටුප් ප්‍රමාණයන් මත වන බදු ඇතුළුව, මුළු ආදායම මත හෝ එහි කොටසක් මත පනවනු ලබන සියළුම බදු, ආදායම් මත වන බදු වශයෙන් සැලකිය යුතුය.

3. මෙම ගිවිසුම අදාල වන්නා වූ දැනට පවතින බදු වනුයේः

   අ) චෙක් ජනරජය සම්බන්ධයෙන්;
      (I) තනි පුද්ගලයින්ගේ ආදායම් මත බදු;
      (II) නෛතික පුද්ගලයන්ගේ ආදායම් මත බදු;

   ආ) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්;

      ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති ව්‍යවසායන්හි පිරිවැටුම මත පදනම්ව ගෙවිය යුතු ආදායම් බදු ද ඇතුළුව, ආදායම් බද්ද,

4. දැනට පවත්නා බදු වලට අතිරේකව හෝ ඒවා වෙනුවට මෙම ගිවිසුම අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව පනවනු ලබන ඒ හා සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ වෙනත් යම් බදු වලට ද මෙම ගිවිසුම අදාළ විය යුතුවේ. ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් ඔවුන්ගේ බදුකරණ නීති පිළිබඳව කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් සම්බන්ධයෙන් එකිනෙකාට දැනුම් දිය යුතුය.

5. ගිවිසුම්ගත රාජ්‍යයන්හි නීති යටතේ පනවන ලද දණ්ඩන, දඩ හෝ පොළී නියෝජනය කරන යම් මුදල් ප්‍රමාණයක් මෙම ගිවිසුමෙන් ආවරණය වන බදු යන්නට ඇතුළත් නොවේ.

3 වැනි වගන්තිය
පොදු අර්ථ නිරූපන

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගත යුතු වුවහොත් මිසः

   අ) "චෙක් ජනරජය" යන පදයෙන් ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ චෙක් ව්‍යවස්ථාව යටතේ චෙක් ජනරජය විසින් සිය පරමාධිපත්‍ය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරනු ලබන චෙක් ජනරජයට අයත් භූමි ප්‍රදේශය අදහස් කෙරේ;

ආ) "ශ්‍රී ලංකාව" යන පදයෙන් ජාත්‍යන්තර නීතියට හා ජාතික ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සිය පරමාධිපත්‍ය අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලබන, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ, රාජ්‍යයට අයත් මුහුදු ප්‍රදේශ, ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම අනන්‍ය ආර්ථික කලාපය සහ මහද්වීප තටකය ද ඇතුළුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ අර්ථ නිරූපනය කර ඇති භූමි ප්‍රදේශය අදහස් කෙරේ;

ඇ) "ගිවිසුම්කාර රාජ්‍යය" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය" යන පද වලින් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි චෙක් ජනරජය හෝ ශ්‍රී ලංකාව අදහස් කෙරේ;

ඈ) "තැනැත්තා" යන පදයට යම් පුද්ගලයෙක්, සමාගමක් සහ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

ඉ) "සමාගම" යන පදයෙන් යම් සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් අස්ථිත්වයක් අදහස් කෙරේ;

ඊ) "ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්" සහ "අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්" යන පදවලින් පිළිවෙලින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් කෙරේ;

උ) "ජාතිකයා" යන පදයෙන්:

i. ගිවිසුම්කාර රාජ්‍යයක ජාතිකත්වය හිමි යම් පුද්ගලයෙකු; සහ

ii. ගිවිසුම්කාර රාජ්‍යයක බලපැවැත්වෙන නීති මගින් ස්වකීය තත්ත්වය ලබන යම් නෛතික තැනැත්තෙකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක්;

අදහස් කෙරේ.

ඌ) "ජාත්‍යන්තර ගමනාගමනය" යන පදයෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක යම් ව්‍යවසායක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක් ක්‍රියාත්මක කරන අවස්ථාවලදී හැර, කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

එ) "නිසි බලධාරියා" යන පදයෙන්:

i. චෙක් ජනරජය සම්බන්ධයෙන්, මුදල් අමාත්‍යවරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු,
ii. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ බලයලත් නියෝජිතයෙකු අදහස් කෙරේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම ගිවිසුමට අයත් විධිවිධාන යොදාගැනීමේ දී වෙනත් අයුරකින් අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනස් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ නම් මිස, මෙම ගිවිසුමට අදාල වූ බදු පිළිබඳව එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ එම පදය දරන අර්ථයම දැරිය යුතු අතර, එම රාජ්‍යයේ බලපවත්නා වූ බදු නීති යටතේ දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ එම පදයට ඇති අර්ථය ඉක්මවා අදාල විය යුතුය.

4 වැනි වගන්තිය
වාසිකයා

1. මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා "ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා" යන පදයෙන් එකී රාජ්‍යයේ නීති යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, නීතිගතවූ හෝ ලියාපදිංචි ස්ථානය, කළමනාකරණ ස්ථානය හෝ එවැනි සමාන ස්වභාවයක වෙනත් යම් නිර්ණායක හේතුවෙන් එම රාජ්‍යයේ දී බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කෙරෙන අතර, එයට එම රාජ්‍යය සහ එහි යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් ද ඇතුළත් වේ. කෙසේ වුවද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණක් එම රාජ්‍යය තුළ දී බද්දට යටත්වන යම් තැනැත්තෙකු, මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයෙකු වන කල්හි, ඔහු පිළිබඳ තත්ත්වය පහත පරිදි තීරණය කළ යුතුය:

අ) ඔහුට නිත්‍ය වාසස්ථානයක් තිබෙන රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට රාජ්‍යයන් දෙකෙහිම නිත්‍ය වාසස්ථානයක් තිබේ නම් ඔහු සමග වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය;

ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් ගිවිසුම්කාර රාජ්‍යයකවත් ඔහුට නිත්‍ය වාසස්ථානයක් නොතිබේ නම්, ඔහුට නිතර වාසය කරන වාසස්ථානයක් ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස ඔහු සලකනු ලැබිය යුතුය;

ඇ) ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම නිතර වාසය කරන වාසස්ථානයක් තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු තමා ජාතිකයෙකු වන රාජ්‍යයේ දී පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය;

ඈ) ඔහු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම ජාතිකයෙකු වේ නම් හෝ ඉන් එකකවත් ජාතිකයෙකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන් හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟතාවයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතුය.

3. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන තනි පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හි, ගිවිසුමේ කාර්යයන් සඳහා ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟතාවයකින් යුතුව, එවැනි තැනැත්තෙකුගේ ක්‍රියාකාරි කළමනාකරණ ස්ථානය, නීතිගත වූ හෝ නැතිනම් සංස්ථාපිත හෝ ස්ථානය සහ වෙනත් යම් අදාල සාධක පිළිබඳ සලකා බලා, කුමන ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු ලෙස සැලකිය යුතු ද යන්න තීරණය කළ යුතුය. එවැනි එකඟතාවයක් නොමැති අවස්ථාවක දී මෙම ගිවිසුම මගින් සපයා ඇති යම් සහනයකට හෝ බදු නිදහස් කිරීමකට එවැනි තැනැත්තෙකු හිමිකම් නොලැබිය යුතුය.

5 වැනි වගන්තිය
ස්ථිර ආයතනය

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා "ස්ථිර ආයතනය" යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ ඉන් කොටසක් කරගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. "ස්ථිර ආයතනය" යන පදයට විශේෂයෙන්:

අ) කළමනාකරණ ස්ථානයක්;
ආ) ශාඛාවක්;
ඇ) කාර්යාලයක්;
ඈ) කර්මාන්ත ශාලාවක්;
ඉ) වැඩපොළක්;
ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල් වලක් හෝ ස්වභාවික සම්පත් ගවේෂණය, සංවර්ධනය හෝ නිස්සාරණය කෙරෙන වෙනත් යම් ස්ථානයක්;සහ
උ) අලෙවිහලක්;

ඇතුළත් වේ.

3. "ස්ථිර ආයතනය" යන පදයෙන් ඉහත අයුරින්ම ;

අ) ගොඩනැගිලි වැඩබිමක්, ඉදිකිරීමේ, එකලස් කිරීමේ හෝ සවිකිරීමේ ව්‍යාපෘතියක් හෝ ඒ හා සම්බන්ධ අධීක්ෂණ කටයුතු ද ඇතුළුව, එහෙත් එම වැඩ බිම, ව්‍යාපෘතිය හෝ එහි කටයුතු මාස හයකට වඩා වැඩි කාලයක් පවතී නම් පමණක්;

ආ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් එකී කාර්යය සඳහා සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා උපදේශන හෝ කළමනාකරණ සේවාවන් ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ කිසියම් දොළොස් මසක කාලපරිච්ඡේදයක් තුළ එකතුව මාස හයක් ඉක්මවන කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේද සඳහා පවතී නම් පමණක්;

අදහස් වේ.

4. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද, "ස්ථිර ආයතනය" යන පදයට

අ) ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් පාවිච්චි කිරීම;

ආ) ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොග, ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පවත්වාගෙන යාම;

ඇ) වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොග පවත්වා ගෙන යාම;

ඈ) ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ හෝ තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

ඊ) උපඡේද (අ) සිට (ඉ) දක්වා සඳහන් කරන ලද කාර්යයන්ගේ ඕනෑම එකතුවක් සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම,

එවැනි ක්‍රියාකාරකමක් හෝ උපඡේද (ඊ) වැනි අවස්ථාවක දී ව්‍යාපාරික ස්ථානයක සමස්ථ ක්‍රියාකාරකම හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයෙන් ඇතුළත් නොවන ලෙස සැලකිය යුතුය.

5. 7 වන ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයකු වන තැනැත්තෙකු හැර යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක දී;

(අ) එම තැනැත්තාගේ කටයුතු ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළේ වුවද එය ස්ථිර ආයතනයක් බවට පත් නොකරන්නා වූ 4 වැනි ඡේදයේ සඳහන් කටයුතු වලට සීමා වන්නේ නම් මිස, ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තා වූ ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ද, තැනැත්තෙකු;

(ආ) එවැනි බලයක් නොමැති වුවත්, පළමු සඳහන් රාජ්‍යයේ දී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන්නා වූ භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොගයකින් ව්‍යවසාය වෙනුවෙන් නිරතුරුව භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය නිකුත් කරන්නා වූ ද තැනැත්තෙකු,

වන්නේ නම් 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන කුමක් වුවද එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් භාරගන්නා වූ යම් කටයුතු සම්බන්ධයෙන් එම ව්‍යවසායට පළමු සඳහන් ගිවසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සැලකිය යුතුය.

6. ප්‍රතිරක්ෂණ සම්බන්ධයෙන් හැර, ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක් 7 වැනි ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයකු වන්නා වූ තැනැත්තෙකු හැර වෙනත් තැනැත්තෙකු මගින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කරන්නේ නම් හෝ එම භූමි ප්‍රදේශය තුළ පවතින යම් අවදානම් රක්ෂණය කරන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් නොසලකා එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සලකනු ලැබිය යුතුය.

7. ස්වකීය සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයකු මගින් යම් රාජ්‍යයක ව්‍යාපාරික කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම එම රාජ්‍ය තුළ ස්ථිර ආයතනයක් ඇති බව නොසැලකිය යුතුය. කෙසේ නමුදු, එවැනි නියෝජිතයෙකුගේ කටයුතු එම ව්‍යවසාය වෙනුවෙන් සම්පූර්ණ වශයෙන්ම හෝ දැනටමත් සම්පූර්ණ වශයෙන් කැපකොට ඇති විටක, එම නියෝජිතයා හා ව්‍යවසායකයා අතර වාණිජ සහ මූල්‍ය සම්බන්ධතා, ස්වාධීන ව්‍යවසායන් අතර සිදුවන එම කටයුතුවලින් වෙනස් වේ නම් මෙම ඡේදයේ අර්ථය තුළ ඔහු නිදහස් තත්ත්වයක් දරන නියෝජිතයකු ලෙස සලකනු නොලැබිය යුතුය.

8. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරයන් (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකට) කරගෙන යාම නිසාවෙන් ම එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතුය.

6 වැනි වගන්තිය
නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි නිශ්චල දේපළවලින් (කෘෂිකර්මයෙන් හෝ වන වගාවෙන් ලබන ආදායම ද ඇතුළුව) ලබන ආදායම එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. "නිශ්චල දේපළ" යන පාඨයට, ප්‍රශ්නගත දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම තිබිය යුතුය. කුමන අවස්ථාවක දී වුව ද මෙම පාඨයට නිශ්චල දේපළවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන වගාවෙහි දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම් දේපළ සම්බන්ධ සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාල අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛනිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනිම හෝ ප්‍රයෝජනයට ගැනිමේ අයිතිවාසිකම් සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් ද ඇතුළත් විය යුතු අතර නැව් සහ ගුවන් යානා නිශ්චල දේපළ ලෙස නොසැලකිය යුතුය.

3. නිශ්චල දේපළ කෙලින්ම ප්‍රයෝජනයට ගැනීමෙන්, කුලියට දීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන ආදායමට මෙම වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධාන අදාල විය යුතුය.

4. 1 වැනි සහ 3 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසාය නිශ්චල දේපලවලින් ලැබෙන ආදායමට ද ස්වාධීන පෞද්ගලික සේවා කරගෙන යාම සඳහා උපයෝගි කරගන්නා නිශ්චල දේපල වලින් ලැබෙන ආඅදයමට ද අදාල විය යුතුය.

7 වැනි වගන්තිය
ව්‍යාපාර ලාභ

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්නේ නම් ව්‍යවසායෙහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එසේ බද්දට යටත් කළ හැකි වන්නේ එම ස්ථිර ආයතනයට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට පමණකි.

2. 3 වැනි ඡේදයේ විධිවිධාන වලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින්, ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක දී එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනනයක් වන්නේ කවර ව්‍යවසායකද, එම ව්‍යවසාය සමග එම තත්ත්වයෙන් හෝ සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතුවල හෝ සමාන කටයුතුවල සම්පූර්ණයෙන් ම, ස්වාධීනව නිරතවන වෙනත් හා වෙන් වූ ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළ හැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සලකනු ලැබිය යුතුය.

3. ස්ථිර ආයතනයක ලාභ තිරණය කිරිමේ දී, විධායක සහ පොදු පරිපාලන වියදම් ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී දරනු ලැබුවේ වුව ද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩදිය යුතුය. කෙසේ වුවද, (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) පේටන්ට් හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් රාජ්‍යභාග ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම් වශයෙන් හෝ විශේෂිත ස්වරූපයේ සේවාවන් ඉටු කිරීම හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ බැංකු ව්‍යවසායක් වන අවස්ථාවක හැර, ස්ථිර ආයතනයකට ණයට දෙන මුදල් මත වන පොළී වශයෙන් හෝ, ස්ථිර ආයතනය විසින් ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් කාර්යාලයකට ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් වෙතොත් ඒ සම්බන්ධයෙන්, එවැනි කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය. එසේම (සත්‍ය වශයෙන්ම දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පමණක් හැර) රාජ්‍යභාග, පේටන්ට් හෝ වෙනත් අයිතිවාසිකම් භාවිතා කිරීම වෙනුවෙන් රාජ්‍යභාග, ගාස්තු හෝ වෙනත් ඒ හා සමාන ගෙවීම්, හෝ විශේෂිත ස්වරූපයේ සේවාවක් ඉටු කිරීම හෝ කළමනාකරණය සඳහා කොමිස් වශයෙන් හෝ, බැංකු ව්‍යවසායක් වන අවස්ථාවක දී හැර, ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි වෙනත් යම් කාර්යාලයකට ණයට දෙන ලද මුදල් මත වන පොළී වශයෙන් හෝ ස්ථිර ආයතනය විසින් ව්‍යවසායේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ එහි වෙනත් කාර්යාලයකින් අය කරන ලද මුදල් ප්‍රමාණයක්, ස්ථිර ආයතනයේ ලාභ නිර්ණය කිරීමේදී ගණන් නොගත යුතුය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය එහි විවිධ කොටස්වලට විභාජනය කිරීමේ ක්‍රමය පදනම් කොටගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළ යුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතින තාක්කල් මෙම වගන්තියේ 2 ඡේදයෙහි ඇති කිසිවක් එම ගිවිසුම්කාර රාජ්‍යය එසේ සිරිත් පරිදි කළහැකි විභජනය කිරීම මගින් බදු අය කළ හැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළැක්විය යුතුය. කෙසේවුවද, අනුගමනය කරන විභජනය කිරීමේ ක්‍රමය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල වන ප්‍රතිඵලය ඇති කරන්නක් විය යුතුය.

5. යම් ස්ථිර ආයතනයක් විසින් ව්‍යවසාය සඳහා හුදෙක් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීම පමණක්ම හේතුවෙන් කිසිදු ලාභයක් එකී ස්ථිර ආයතනයට ආරෝපණය නොකළ යුතුය.

6. එසේ නොකිරීමට සුදුසු හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, ඉහත ඡේදයන්හි කාර්යයන් සඳහා, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමයක් මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළ යුතු ලාභය තීරණය කළ යුතුය.

7. මෙම ගිවිසුමෙහි වෙනත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් අයිතම ලාභවලට ඇතුළත් වන අවස්ථාවකදී, එකී වගන්තිවල විධිවිධාන සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන බල නොපෑ යුතුය.

8 වැනි වගන්තිය
නාවික සහ ගුවන් ප්‍රවාහනය

1. ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් හෝ ගුවන්යානා මෙහෙයුම් කිරීමෙන් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් ලබන ලාභ, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ හැක.

2. 1 වන ඡේදයෙහි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් මෙහෙයුම් කිරීමෙන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක් තුළ තිබෙන මූලාශ්‍රයන්ගෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් ලබන ලාභ, එම රාජ්‍යයේ නීතිවලට අනුව බද්දට යටත් කළ හැකි නමුත්, එසේ අය කරනු ලබන බද්දෙන් 50%කට සමාන ප්‍රමාණයක් අඩු කළ යුතුය.

3. කිසියම් සංචිතයකට සහභාගි වීමෙන්. බද්ධ ව්‍යාපාරයකින් හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකින් ලැබෙන ලාභ වලට ද, 1 හා 2 වැනි ඡේදයන්හි විධිවිධාන අදාළ විය යුතු නමුදු, එසේ උපයාගන්නා ලද ලාභ, එම ඒකාබද්ධ මෙහෙයුමට සහභාගිවන්නාගේ ඒකාබද්ධ මෙහෙයුමේ තම කොටසට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට පමණක් සීමා වේ.

4. 12 වැනි වගන්තියේ විධිවිධාන කුමක් වුවද මෙම වගන්තියේ කාර්යය සඳහා, ජාත්‍යන්තර ගමනාගමනයේදී නැව් හෝ ගුවන්යානා මෙහෙයුම් කිරීමෙන් ලබන ලාභ යන්නට:

(අ) හිස් බෝට්ටු පදනම මත නැව් හෝ ගුවන්යානා වලින් ලැබෙන කුලී වලින් ලැබෙන ලාභ; සහ
(ආ) කන්ටේනර් භාවිතය, නඩත්තුව හෝ කුලී වලින් ලැබෙන ලාභ (ට්‍රේලර් හා කන්ටේනර් ප්‍රවාහනය සම්බන්ධ උපකරණ ඇතුළත්ව)
ඇතුළත් වේ.

එම කුලී හෝ එම භාවිතය, නඩත්තුව හෝ කුලී ඇති වන අවස්ථාවක දී, ජාත්‍යන්තර ගමනාගමනයේ දී නැව් හෝ ගුවන් යානා මෙහෙයුම් කිරීමට අනුශාංගික වේ.

9 වැනි වගන්තිය
සම්බන්ධිත ව්‍යවසායන්

1. අ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගිවන අවස්ථාවක, හෝ

ආ) එකම තැනැත්තන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට සෘජුව හෝ වක්‍ර ලෙස සහභාගි වන අවස්ථාවක, සහ

ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවක දී වුවද, ස්වාධීන ව්‍යවසායන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර පිළියෙළ කර හෝ පනවා ඇති කල්හි, ඒ කොන්දේසි නොතිබුණි නම්, ඒ ව්‍යවසායන්ගෙන් එකකට උපචිත විය හැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුව ද, ඒ ව්‍යවසායේ ලාභවලට ඇතුළත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකිය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එම රාජ්‍යයේ ව්‍යවසායක ලාභයට ඇතුළත් කරනු ලබන සහ බද්දට යටත් කරනු ලබන ලාභ, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලැබ එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ එසේ ඇතුළත් කර ඇති ලාභ, ව්‍යවසායන් දෙක අතර ඇති කරගත් කොන්දේසි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ කොන්දේසිම වන විටක, පළමුව සඳහන් කර ලද රාජ්‍යයේ ව්‍යවසායකට උපචිත විය හැකිව තිබූ ලාභ වන්නේ නම් එවිට එම ලාභ මත අයකරනු ලබන බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක්, එම අනෙක් රාජ්‍යය විසින් කළ යුතුය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේ දී, මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධාන කෙරෙහි ද නිසි අවධානය යොමු කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් එකිනෙකා විමසිය යුතු වන්නේ ය.

3. වංචාව, දැඩි නොසැලකිල්ල හෝ හිතාමතා පැහැර හැරීම සම්බන්ධයෙන් 2 වන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

10 වැනි වගන්තිය
ලාභාංශ

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේ වුවද, ලාභාංශ ගෙවන සමාගම වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිවලට අනුකූලව එවැනි ලාභාංශවලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අයකරන බද්ද;

අ) අර්ථලාභී හිමිකරු ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් සියයට 10 ක් සඳහා සෘජු හිමිකම් සහිත සමාගමක් වේ නම් දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 7.5 කට ද;

ආ) අන් සියළුම අවස්ථාවල දී දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 10 කටද,
වැඩි නොවිය යුතුය.
ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ලාභ සම්බන්ධයෙන්, සමාගමෙන් බදු අය කිරීමේදී මෙම ඡේදය බලනොපෑ යුතුය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි "ලාභාංශ" යන පදයෙන් කොටස්වලින් හෝ ණය හිමිකම් නොවන්නා වූ වෙනත් අයිතිවාසිකම්වලින් ලාභයට සහභාගිවීමෙන් ලබන අදායම් මෙන්ම, රාජ්‍යයේ බලපවත්නා නීතියට යටත්ව යම් වාසික සමාගමක් එකී කොටස් මත බෙදාහැරීමේදී හෝ ගෙවීමේදී අදාළ වන බදුකරණ රීතින්ට සමානව බද්දට යටත්වන්නා වූ,

(අ) සංස්ථාපිත අයිතිවාසිකම්වලින් ලැබෙන ආදායම්; සහ

(ආ) වෙනත් ආදායම් ද,

අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ ලාභාංශවල අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගම වාසික වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එම ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම් හෝ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරන්නේ නම් සහ ලාභාංශ ගෙවනු ලබන කොටස් දරන සමාගම එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ඵලදායී ලෙස සම්බන්ධව පවතී නම්, 1 වන හා 2 වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවන්හි දී අවස්ථාවෝචිත පරිදි 7 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවක දී, එම සමාගම එම අනෙක් රාජ්‍යයේ වාසිකයකුට ලාභාංශ ගෙවනු ලබන විටෙක හෝ එම අනෙක් රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයකට හෝ ස්ථාවර පදනමකට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති කොටස් දැරීමක් සම්බන්ධයෙන් වන විටෙක හැර, සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, සමාගමේ ගෙවන ලද ලාභාංශ හෝ නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙහි පැන නගින ලාභ හෝ ආදායම්වලින් මුළුමනින්ම හෝ අඩ වශයෙන් සමන්විත වන්නේ වුවද, සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකර ද සිටිය හැක.

11 වැනි වගන්තිය
පොළිය

1. ගිවිසුම්කාර රාජ්‍යයක දී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකුට ගෙවනු ලබන විටෙක දී එම පොළිය එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේවුවද, එම පොළියෙන් එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද, එම රාජ්‍යයේ නීතිය අනුව බදු අය කළ හැකි නමුත්, පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොළී ප්‍රමාණයෙන් සියයට 5ක් නොඉක්මවිය යුතුය.

3. 2 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන්නා වූ පොළිය සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයකුගේ අර්ථලාභී හිමිකම මත පොළිය ගෙවනු ලබන්නේ:

අ) යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ එහි පළාත් පාලන අධිකාරියක් ඇතුළුව අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආණ්ඩුවට;

ආ) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ මහ බැංකුවට;

ඇ) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආණ්ඩුව විසින් හිමිකාරිත්වය දරන හෝ පාලනය කරනු ලබන ආයතනයකට, එකී ආයතනය අපනයනය හෝ ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පවත්වාගෙන යන්නේ නම්; හෝ

ඈ) යම් ණය හෝ බැර සම්බන්ධයෙන් ඇපකරයක් වන;

(i) යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ එහි පළාත් පාලන අධිකාරියක් ඇතුළුව අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආණ්ඩුවක් විසින්, හෝ

(ii) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ මහ බැංකුව විසින්, හෝ

(iii) අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ආණ්ඩුව විසින් හිමිකාරිත්වය දරන හෝ පාලනය කරනු ලබන ආයතනයක් විසින්, එකී ආයතනයේ පැවැත්ම අපනයන සහ ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යයට යොදවන්නේ නම්;

අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු වේ.

4. මෙම වගන්තියේ යෙදී ඇති "පොළිය" යන පදයෙන්, උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, සහ ණයගැතියාගේ ලාභවලට සහභාගිවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියලු වර්ගයන්හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ සුරැකුම්පත්වලින් ලැබෙන ආදායම සහ බැඳුම්කර හෝ ඍණපත්‍ර වලින් ලැබෙන ආදායම එවැනි සුරැකුම්පත්, බැඳුම්කර හෝ ඍණපත්‍ර වලට බැඳී ඇති අධි මිල සහ ත්‍යාග ද ඇතුළත්ව අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් අය කරන දණ්ඩන ගාස්තු පොළිය ලෙස සලකනු නොලැබිය යුතුය. 10 වැනි වගන්තියේ 3 වැනි ඡේදයේ විධිවිධාන යටතේ ලාභාංශ ලෙස සලකනු ලබන යම් ආදායම් අයිතමයක් "පොළිය" යන පදයෙහි ඇතුළත් නොකළ යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ පොළී ආදායමෙහි අර්ථලාභී හිමිකරු, පොළිය උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එහි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්නේ නම් හෝ එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති ස්ථාවර පදනමක් මගින් එම රාජ්‍යයේ දී ස්වාධීන පෞද්ගලික සේවාවන් ඉටුකරන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග, ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත්නම්, 1, 2 හා 3 වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවල දී මෙම ගිවිසුමේ 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතුය.

6. පොළිය ගෙවන්නා එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, පොළිය එම රාජ්‍යයේ දී උද්ගත වන ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත් පොළී ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු වුවද නොවූවද, ඔහුට පොළිය ගෙවීමට හේතු වූ ණයගැතිභාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවක දී සහ එම පොළිය දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන රාජ්‍යයේ දී එම පොළිය උද්ගත වන ලෙස සැලකිය යුතුය.

7. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තකු අතර පවත්නා විශේෂ සම්බන්ධයක් නිසා ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී ණය හිමිකම සැලකිල්ලට ගනිමින්, ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකඟ විය හැකිව තිබූ ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මෙම වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුත්තේ අවසානයේ සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක ගෙවීම් වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමේ අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින්, ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බද්දට යටත් කළ යුතුය.

12 වැනි වගන්තිය
රාජ්‍යභාග සහ තාක්ෂණික සේවා ගාස්තු

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගතවන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවනු ලබන රාජ්‍යභාග සහ තාක්ෂණ සේවා ගාස්තු, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේ වෙතත්, එම රාජ්‍යභාග හා තාක්ෂණික සේවා ගාස්තු, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී ද, එම රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළ හැකි නමුත් රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවාවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කෙරෙන බද්ද, එම රාජ්‍යභාගවල හෝ තාක්ෂණික සේවා ගාස්තු දළ ප්‍රමාණයෙන් 10% නොඉක්මවිය යුතුය.

3. (අ) මෙම වගන්තියේ යොදා ඇති පරිදි රාජ්‍යභාග යන පදයෙන් කිසියම් සාහිත්‍යමය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක ප්‍රකාශන අයිතියක්, සිනමා රූපක චිත්‍රපට සහ පටල හෝ වෙනත් අනුරූප හෝ ශබ්ද ප්‍රතිනිර්මාණ, කිසියම් පේටන්ට් බලපත්‍රයක්, වෙළඳ ලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පිඹුරක්, රහස්‍ය වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක්, කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක උපකරණ හෝ විද්‍යාත්මක, වාණිජමය හෝ කාර්මික අත්දැකීම් සම්බන්ධ තොරතුරු, පාවිච්චි කිරීමට හෝ පාවිච්චි කිරීමේ අයිතිය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීම් අදහස් කෙරේ.

(ආ) මෙම වගන්තියේ යොදා ඇති තාක්ෂණික සේවා ගාස්තු යන පදයෙන් තාක්ෂණික, උපදේශන හෝ කළමනාකරණ ස්වභාවයේ ඕනෑම සේවාවක් සඳහා ප්‍රතිෂ්ඨාවක් ලෙස සැලකෙන ඕනෑම ගෙවීමක් අදහස් වන නමුදු 5 වැනි වගන්තියේ 3 වැනි ඡේදයේ (අ) උපඡේදයේ සහ 8, 15, 16, 17 සහ 19 වැනි වගන්තිවල සඳහන් සේවාවන් සඳහා වන ගෙවීම් ඇතුළත් නොවේ. එමෙන්ම යම් තැනැත්තෙකුගේ පුද්ගලික භාවිතය උදෙසා වන අරමුණින් යුතුව සැපයෙන සේවාවන් සහ අධ්‍යාපන ආයතනවලට හෝ ඔවුන් විසින් කරන ලද ඉගැන්වීම් සඳහා යම් තැනැත්තෙකු විසින් සිදු කරනු ලබන ගෙවීම් මෙම යෙදුමට ඇතුළත් නොවේ.

4. රාජ්‍යභාගවල ආර්ථලාභී හිමිකරු ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුව, රාජ්‍යභාග උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් කරගෙන යන අවස්ථාවක හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය තුළ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන සේවා පවත්වාගෙන යන අවස්ථාවක සහ රාජ්‍යභාග ගෙවනු ලබන්නේ කවර අයිතිවාසිකමක් හෝ දේපළක් සම්බන්ධයෙන් ද, එම අයිතිවාසිකම හෝ දේපළ, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම් මෙම වගන්තියේ 1 වැනි සහ 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. ගෙවන්නා එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, රාජ්‍යභාග හා තාක්ෂණික සේවා සඳහා ගාස්තු එම ගිවිසුම්කාර රාජ්‍යයේ උද්ගත වන ලෙස සැලකිය යුතුය. එසේ වුවද, රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා ගාස්තු ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුවද, නොවුවද, රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු උද්ගතවීමට තුඩු දෙන අයිතියක් හෝ දේපළක් සමග ඵලදායී ලෙස බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම් සහ එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් දරනු ලබන්නේ නම්, එවැනි අවස්ථාවක එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ දී එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා උද්ගත වන ලෙස සැලකිය යුතුය.

6. ගෙවන්නා හා අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා ගෙවනු ලබන රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ප්‍රමාණය, භාවිතය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගනිමින්, එවැනි සම්බන්ධතාවයක් නොමැති විට ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු විසින් එකඟවිය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක දී ගෙවීම් වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධානයන් සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින් ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් කළ යුතුය.

13 වැනි වගන්තිය
ප්‍රාග්ධන ලාභ

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් 6 වැනි වගන්තියේ සඳහන් වූ සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියා වූ නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ඇති ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළෙහි කොටසක් වන හෝ චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා එහි ඇති ස්ථාවර පදනමකට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමග) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් ව්‍යාපාර දේපළෙහි කොටසක් වන දේපළ සහ එම ව්‍යවසාය අන්තර්ජාතික ගමනාගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන්යානා මෙහෙයුම් කිරීමෙන් සමන්විත වන හෝ එම නැව් හෝ ගුවන්යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ, එකී රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

4. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක කොටස් හෝ වෙනත් පොළී හිමිකම අන්සතු කිරීම මගින් උපයන ලාභ අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැක,

5. පූර්ව ඡේදවල සඳහන් දේපළ හැර ඕනෑම දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම දේපළ අන්සතු කරන්නා වාසිකයෙකුව සිටින ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කල යුතු ය.

14 වැනි වගන්තිය
ස්වාධීන පෞද්ගලික සේවා

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ද බද්දට යටත් කළ හැකි පහත සඳහන් අවස්ථාවලදී හැර, වෘත්තීය සේවා හෝ ස්වාධීන ස්වභාවයේ වෙනත් ක්‍රියාකාරකම් වෙනුවෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් ලබන ආදායම, එම රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු ය.

   අ) තම කටයුතු ඉටුකර ගැනීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථාවර පදනමක් නිරන්තරව ඔහුට ඇති කල්හි, එම ස්ථාවර පදනම සඳහා ආරෝපණය කළ හැකි ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

ආ) කාලපරිච්ඡේදයක අදාළ මූල්‍ය වර්ෂය ආරම්භවන හෝ අවසානවන යම් දොළොස්මසක් තුළ දී එකතුව දින 183 ක් හෝ ඉක්මවන කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් තුළ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගත කරන විට එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සිය කටයුතුවලින් ලබන ආදායම පමණක් එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. "වෘත්තීය සේවා" යන පදයට ස්වාධීන විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ නීතිඥයින්ගේ ඉංජිනේරුවරුන්ගේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරිවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද විශේෂයෙන් ඇතුළත් වේ.

3. 1 වන ඡේදයේ (ආ) වන උපඡේදයේ සඳහන් කර ඇති කාලපරිච්ඡේදය ගණනය කිරීමේදී පහත සඳහන් දිනයන් ද ඇතුළත් විය යුතු ය.

(අ) පැමිණීමේ සහ පිටවීමේ දිනයන් ද ඇතුළු භෞතිකව පෙනී සිටි සියලු දිනයන්; සහ

(ආ) එකී රාජ්‍යයේ භූමි ප්‍රදේශයේ ක්‍රියාකාරකම ස්ථාපිත වීමෙන් පසු ක්‍රියාකාරකම පවතින රාජ්‍යයෙන් පිටත ගත කළ සෙනසුරාදා සහ ඉරිදා, ජාතික නිවාඩු, නිවාඩු වැනි දිනයන් සහ එකී රාජ්‍යයේ ලබන්නාගේ ක්‍රියාකාරකමේ කාර්ය සාධනය සමග ඍජුව සම්බන්ධ වූ ව්‍යාපාරික සංචාරයක්.

15 වැනි වගන්තිය
පරායත්ත පෞද්ගලික සේවා

1. 16, 18 සහ 19 වන වගන්තිවල විධිවිධානයන්ට යටත් ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියක් වෙනුවෙන් උපයන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නම් මිස, එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් විය යුතුය. එසේ සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් ලබන පාරිශ්‍රමික එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. 1 වැනි ඡේදයේ විධිවිධානයන් හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි යෙදෙන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය පහත කොන්දේසි සපුරාලන්නේ නම්;

අ) ලබන්නා අදාළ මූල්‍ය වර්ෂය ආරම්භ වන හෝ අවසන් වන යම් දොළොස් මසක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183 කට නොවැඩි කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් අනෙක් රාජ්‍යයේ සේවා නියුක්තියේ නිරත වන; සහ

ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවායෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම්; සහ

ඇ) එම පාරිශ්‍රමිකය, සේවායෝජකයාට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

3. 2 වන ඡේදයේ (අ) උපඡේදයේ සඳහන් කර ඇති කාලපරිච්ඡේදය ගණනය කිරීමේ දී පහත සඳහන් දිනයන් ද ඇතුළත් විය යුතුය.

(අ) පැමිණීමේ සහ පිටවීමේ දිනයන් ද ඇතුළුව භෞතිකව පෙනී සිටි සියලුම දිනයන්; සහ

(ආ) එකී රාජ්‍යයේ භූමි ප්‍රදේශයේ ක්‍රියාකාරකම නැවත ස්ථාපිත වීමෙන් පසු ක්‍රියාකාරකම පවතින රාජ්‍යයෙන් පිටත ගත කළ සෙනසුරාදා, ඉරිදා, ජාතික නිවාඩු, නිවාඩු වැනි දිනයන් සහ එකී රාජ්‍යයේ ලබන්නාගේ සේවානියුක්තිය සමග ඍජුව සම්බන්ධ වූ ව්‍යාපාරික සංචාරයන්.

4. 2 වන ඡේදයේ (ආ) උප ඡේදයේ "සේවායෝජකයා" යන්නෙන් සපයනු ලබන කාර්යය පිළිබඳ අයිතිය සහ ඉටුකරනු ලබන කාර්යයන් හා සම්බන්ධව වගකීම සහ අවදානම දරන පුද්ගලයා යන්න අදහස් වේ.

5. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක හෝ ගුවන්යානයක් තුළ කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් උපයනු ලබන පාරිශ්‍රමිකය, එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැක.

16 වැනි වගන්තිය
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු

ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයක හෝ වෙනත් ඒ හා සමාන ව්‍යුහයක සාමාජිකයෙකු වශයෙන් උපයන අධ්‍යක්ෂ ගාස්තු හා ඊට සමාන ගෙවීම්, එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

17 වැනි වගන්තිය
කලා ශිල්පීන් සහ ක්‍රීඩකයන්

1. 14 වැනි සහ 15 වැනි වගන්තිවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු නාට්‍ය, චලන චිත්‍රපට, ගුවන් විදුලි හෝ රූපවාහිනී කලා ශිල්පියකු හෝ සංගීතඥයකු වැනි විනෝදය සපයන්නකු ලෙස හෝ ක්‍රීකඩයකු වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ස්වකීය පුද්ගලික ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් උපයන ආදායම, එම අනක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. විනෝදය සපයන්නෙකු හෝ ක්‍රීඩකයකු වශයෙන් ඔහුගේ එම පුද්ගලික ක්‍රියාකාරකම්වල නිරත වීම සම්බන්ධයෙන් වන ආදායම, එම විනෝද සපයන්නාටම හෝ ක්‍රීඩකයාටම නොව, වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවක දී, 7 වැනි, 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වුවද, එම ආදායම විනෝදය සපයන්නාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

18 වැනි වගන්තිය
විශ්‍රාම වැටුප් සහ වාර්ෂික

1. 19 වන වගන්තියේ 2 වැනි ඡේදයේ විධිවිධානයන්ට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අතීත සේවානියුක්තිය ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ගෙවූ විශ්‍රාම වැටුපක් හෝ වෙනත් සමාන පාරිශ්‍රමික සහ වාර්ෂික එකී රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

2. "වාර්ෂික" යන පදයෙන්, මුදලින් හෝ මුදලේ වටිනාකමෙන් ප්‍රමාණවත් හා සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවන් වෙනුවෙන් ගෙවීම් කිරීමේ බැඳියාවක් යටතේ ඔහුගේ ආයු කාලය තුළ දී හෝ විශේෂයෙන් සඳහන් කරන ලද හෝ නිශ්චය කළ හැකි කාලපරිච්ඡේදයක් තුළ දී, ප්‍රකාශිත වේලාවන්හි දී කාලීනව ගෙවිය යුතු වන ප්‍රකාශිත මුදලක් අදහස් වේ.

19 වැනි වගන්තිය
ආණ්ඩුවේ සේවය

1. අ) ගිවිසුම්කාර රාජ්‍යයක හෝ දේශපාලන උපකොට්ඨාසයක් හෝ පළාත් පාලන අධිකාරියක් විසින් එම රාජ්‍යය හෝ උපකොට්ඨාසය හෝ අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන වැටුප්, වේතන සහ වෙනත් සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

   ආ) කෙසේ වුවද, එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී නම් සහ එකී පුද්ගලයා එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, ඔහු;

   (i) එම අනෙක් රාජ්‍යයේ ජාතිකයෙකු වේ නම්; හෝ

   (ii) හුදෙක් එම සේවාව ඉටු කිරීමේ කාර්යය සඳහාම පමණක් එම රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් නොවූ තැනැත්තෙකු නම්;

   එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පරිශ්‍රමිකයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

2. අ) 1 වන ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ දේශපාලන උපකොට්ඨාසයක් හෝ පළාත් පාලන අධිකාරියක් විසින් හෝ ඒවායින් ඇති කරන ලද අරමුදල්වලින් එම රාජ්‍යයක හෝ එහි දේශපාලන උපකොට්ඨාසය හෝ පළාත් පාලන අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන විශ්‍රාම වැටුප්, වෙනත් සමාන පාරිශ්‍රමිකයන් හෝ වාර්ෂික එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

ආ) කෙසේ නමුදු, එවැනි විශ්‍රාම වැටුප්, වෙනත් සමාන පාරිශ්‍රමික සහ වාර්ෂික අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ යුත්තේ, එම පුද්ගලයා එකී රාජ්‍යයේ වාසිකයෙකු සහ ජාතිකයෙකු වන්නේ නම් පමණි.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උපකොට්ඨාසයක් හෝ එකී පළාත් පාලන අධිකාරියක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන්ට අදාළ වන වැටුප්, වේතන, විශ්‍රාම වැටුප්, වෙනත් සමාන පාරිශ්‍රමික සහ වාර්ෂික සම්බන්ධයන් 15, 16 සහ 18 වගන්තිවල විධිවිධානයන් අදාළ විය යුතුය.

20 වැනි වගන්තිය
ශිෂ්‍යයන් සහ ආධුනිකයන්

ගිවිසුම්කාර රාජ්‍යයකට පැමිණීමට පූර්වාසන්නයෙහි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි වාසිකයෙකු වූ හෝ වාසිකයෙකු වන, ස්වකීය අධ්‍යාපන හෝ පුහුණුව යන කාර්යයන් සඳහා පමණක්ම පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින ශිෂ්‍යයෙකු හෝ ආධුනිකයෙකු ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා ලැබූ ගෙවීම් එම පළමු සඳහන් රාජ්‍යයෙන් පරිබාහිර ප්‍රභවයන්ගෙන් සිදු කරන්නේ නම්, එම පළමුව සඳහන් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතුය.

21 වැනි වගන්තිය
වෙනත් ආදායම්

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන ආදායම් අයිතමයන් කොතැනක උද්ගත වුවද, එම ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වෙමින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පුද්ගලික සේවාවක් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම හෝ දේපළ ඉහත සඳහන් ස්ථිර ආයතනයට හෝ ස්ථාවර පදනමට ඵලදායි ලෙස සම්බන්ධ වී ඇති නම්, 6 වන වගන්තියේ 2 ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපලවලින් ලැබෙන ආදායම, නොවන ආදායමට මෙම වගන්තියෙහි 1 ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය. එබඳු අවස්ථාවන්හි දී 7 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුත්තේය.

3. මෙම වගන්තියේ 1 වන සහ 2 වන ඡේද වල විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී උද්ගතවන ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ ආදායම් අයිතමයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ද බද්දට යටත් කළ හැකිය.

22 වැනි වගන්තිය
ද්විත්ව බදුකරණය ඉවත් කිරීම

1. මෙම ගිවිසුමෙහි විධිවිධානවලට අනුව ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බදු ගෙවිය යුතු ආදායමක් උපයන කල්හි පළමුව සඳහන් කළ ගිවිසුම්කාර රාජ්‍යය විසින් එම වාසිකයාගේ ආදායම මත බද්දෙන් අනෙක් රාජ්‍යයේ දී ගෙවූ ආදායම් බද්දට සමාන ප්‍රමාණයක් අඩු කිරීමක් ලෙස ඉඩදිය යුතුය.

   කෙසේ නමුදු එවැනි අඩු කිරීමක්, අඩු කිරීම් ලබාදීමට පෙර ගණනය කරන ලද අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් වන ආදායමට ආරෝපණය කළ හැකි ආදායම් බද්දේ කොටස නොඉක්මවිය යුතුය.

2. ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම, මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව එකී රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වන විට, එතකුදු වුවත් එවැනි රාජ්‍යයක් විසින් එම වාසිකයාගේ ඉතිරි ආදායම මත බදු මුදල ගණනය කිරීමේ දී එසේ නිදහස් කරනු ලැබූ ආදායම සැලකිල්ලට ගනු ලැබිය හැකිය.

3. මෙම වගන්තියේ 1 වන ඡේදයේ කුමක් සඳහන් වුවද, එහි දේශීය නීතීන් මගින් ඉඩදෙන්නේ නම් සහ මෙම නීතිවලට අනුකූල වන්නේ නම් නිදහස් කිරීමේ ක්‍රමය ගිවිසුම්කාර රාජ්‍යයක් තුළ ද අදාළ කරගත හැකිය.

23 වැනි වගන්තිය
වෙනස් ලෙස නොසැලකීම

1. එකී ගිවිසුම්කාර රාජ්‍යයක ජාතිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, විශේෂයෙන් වාසිකභාවය සලකා, එම අනෙක් රාජ්‍යයේ ඒ හා සමාන තත්ත්වයේ සිටින ජාතිකයන්ට වඩා වෙනස් වූ හෝ දැරීමට වඩාත් දුෂ්කර වූ යම් බදු අය කිරීමකට හෝ ඒ හා සම්බන්ධ යම් අවශ්‍යතාවයකට යටත් කරනු නොලැබිය යුතුය. 1 වැනි වගන්තියේ විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද ගිවිසුම්කාර රාජ්‍යයක හෝ රාජ්‍යයන් දෙකෙහිම වාසිකයෙකු නොවන පුද්ගලයන් සඳහා ද මෙම විධිවිධාන අදාළ විය යුතුය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් සතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති බදුකරණය වන ස්ථිර ආයතනයක් හෝ එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පවතින ස්ථාවර පදනමක් මත, එම කටයුතුවලම නියැලෙන අනෙක් රාජ්‍යයේ ව්‍යවසායන් හෝ වාසිකයන් සම්බන්ධයෙන් අයකරනු ලබන බදු වලට වඩා අඩු වාසි සැලසෙන පරිදි එකී අනෙක් රාජ්‍යයේ දී බදු අය නොකළ යුතුය. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් සිය වාසිකයන්ට සිවිල් තත්ත්වය හෝ පවුලේ වගකීම හේතු කොටගෙන බදු කාර්යය සඳහා දෙනු ලබන පෞද්ගලික දීමනා, සහන සහ අඩු කිරීම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ලබාදීමට මෙම විධිවිධානය මගින් බැඳෙනු ඇතැයි යනුවෙන් තේරුම් නොගත යුතුය.

3. මෙම ගිවිසුමේ 9 වන වගන්තියේ 1 වන ඡේදයේ, 11 වන වගන්තියේ 7 වන ඡේදයේ හෝ 12 වන වගන්තියේ 6 වැනි ඡේදයේ විධිවිධාන බලපවත්නා අවස්ථාවල දී හැර, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන පොළී, රාජ්‍යභාග, තාක්ෂණික සේවා සඳහා වන ගාස්තු සහ අනෙකුත් වියදම් එවැනි ව්‍යවසායක බදු අය කළ හැකි ලාභ නිර්ණය කිරීමේ කාර්යය සඳහා පළමුව සඳහන් රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලැබූ ආකාරයටම එම කොන්දේසි යටතේම අඩු කළ යුතුය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායන් හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයිතිව හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායන් යටත් වන හෝ යටත් කළ හැකි වන බදුකරණයට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ දුෂ්කර වූ කිසිදු බදුකරණයකට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහි දී යටත් කරනු නොලැබිය යුතුය.

5. 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද සෑම ආකාරයකම සහ විස්තරයකම බදු සඳහා මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

24 වැනි වගන්තිය
අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියා පිළිවෙළ

1. ගිවිසුම්කාර රාජ්‍යයන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍ර වන්නේ යයි හෝ එසේ පාත්‍ර වී ඇතැයි පුද්ගලයෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි දේශීය නීති මගින් සලසා ඇති විධිවිධානයන් නොසලකා, ඔහු වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිය. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූල නොවන බදුකරණය උද්ගතවීමට හේතුවන ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරීම කළ යුතුය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම්, මෙම ගිවිසුමට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමග අන්‍යෝන්‍ය එකඟත්වයෙන් තත්ත්වය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සාහ කළ යුතුය. එළඹෙන ලද යම් එකඟතාවයක් ගිවිසුම්කාර රාජ්‍යයන්හි දේශීය නීතිය යටතේ පවතින කාලය පිළිබඳ යම් සීමා කිරීම්වලට යටත් නොකර ක්‍රියාත්මක කළ හැකිය.

3. මෙම ගිවිසුම අර්ථ නිරූපනය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන්, යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පවතී නම් ඒවා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන් අන්‍යෝන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කරගැනිමට උත්සාහ කළ යුතුය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හි දී ද, ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ හැකිය.

4. පෙර සඳහන් ඡේදවල අර්ථ දැක්වීම සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට සෘජුවම, එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත හැකිය.

25 වැනි වගන්තිය
තොරතුරු හුවමාරු කරගැනීම

1. මෙම ගිවිසුමෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ගිවිසුම්කාර රාජ්‍යයන්, එහි දේශපාලන උපකොට්ඨාස හෝ පළාත් පාලන අධිකාරියන් වෙනුවෙන් පනවන ලද ඕනෑම වර්ගයකට හෝ විස්තරයකට අයත් බදු සම්බන්ධයෙන් වන දේශීය නීතීන්, එහි දැක්වෙන බදුකරණය මෙම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ නොවනතාක්දුරට, පරිපාලනය හෝ බලාත්මක කිරීම සඳහා අදාළ වන්නේ යැයි පූර්ව නිගමනයකට එළඹිය හැකි වන්නා වූ තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් විසින් හුවමාරු කරගත යුතුය. තොරතුරු හුවමාරු කරගැනීම 1 වැනි සහ 2 වැනි වගන්තිවලින් සීමා නොවේ.

2. 1 වන ඡේදය යටතේ ගිවිසුම්කාර රාජ්‍යයකට ලැබෙන යම් තොරතුරක්, එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබාගත් තොරතුරු රහස්‍ය සේ සලකන පරිද්දෙන්ම සැලකිය යුතු අතර, 1 වන ඡේදයේ සඳහන් බදුවලට අදාළ තක්සේරු කිරීම හෝ අය කිරීම, ඒ සම්බන්ධයෙන් බලාත්මක කිරීම හෝ නඩු පැවරීම, එම බදු සම්බන්ධ අභියාචනා තීරණය කිරීම හෝ ඒවාට අදාළ යම් මග හැරීමක් එම කාරණය හා සම්බන්ධ වූ තැනැත්තන්ට හා බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩලද ඇතුළුව) පමණක් හෙළි කළ යුතුය.

එවැනි තැනැත්තන්ට හා බලධරයන්ට එවැනි කටයුතු සඳහා පමණක් මෙම තොරතුරු භාවිතා කළ හැකිය. ඔවුන්ට ප්‍රසිද්ධ උසාවි කටයුතුවල දී හෝ අධිකරණ තීන්දුවල දී එම තොරතුරු හෙළි කළ හැකිය. ඉහත කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් ලබාගන්නා තොරතුරු වෙනත් කාර්යයන් සඳහා යොදාගැනීමට රාජ්‍යයන් දෙකෙහිම නීතීන් යටතේ හැකි විටකදී, සහ තොරතුරු ලබදෙන රාජ්‍යයේ නිසි බලධාරියා විසින් එලෙස යොදාගැනීමක් අනුමත කරන්නේ නම්, එකී වෙනත් කාර්යයන් සඳහා යොදාගත හැකිය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් මත,

අ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති හෝ පරිපාලනමය භාවිතයන් වලින් වෙනස් ආකාරයට පරිපාලනමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලනමය ක්‍රියාවලියේදී ලබාගත නොහැකි තොරතුරු සැපයීම;

ඇ) යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ හෝ වෘත්තීය රහසක් හෝ වෙළඳ ක්‍රියාවලියක් හෝ රජයේ ප්‍රතිපත්තියට පටහැනි වන යම් තොරතුරක්, (order public) සම්බන්ධ තොරතුරු සැපයීම

යන ආදී බැඳීම් පැනවෙන්නේ යැයි කිසිදු අවස්ථාවක දී තේරුම් නොගත යුතුය.

4. මෙම වගන්තියට අනුකූලව යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් තොරතුරු අපේක්ෂා කරන්නේ නම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් තම බදු පරමාර්ථයන් සඳහා එවැනි තොරතුරු අවශ්‍ය නොවන්නේ වුවද, අපේක්ෂිත තොරතුරු ලබාගැනීම පිණිස තම තොරතුරු රැස්කිරීමේ ක්‍රියාමාර්ග භාවිතා කළ යුතුය. පූර්ව වාක්‍යයෙහි වූ බැඳීම 3 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත් වන නමුත් කිසිදු අවස්ථාවකදී එකී සීමාවන් මගින් ගිවිසුම්කාර රාජ්‍යයක්, හුදෙක් එවැනි තොරතුරු සම්බන්ධයෙන් දේශීය වශයෙන් උනන්දුවක් නැති නිසාම එම තොරතුරු සපයා දීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස තේරුම් නොගත යුතුය.

5. තොරතුරු, හුදෙක් බැංකුවක්, වෙනත් මූල්‍යායතනයක්, නියෝජිත ආයතනයක් වෙනුවෙන් හෝ පීත කොමිසමක භාරකරු වශයෙන් නාමිකයෙකු හෝ තැනැත්තෙකු භාරයේ පැවතීම හේතුවෙන්ම හෝ එය තැනැත්තෙකුගේ අයිතිය පිළිබඳ හිමිකම්වලට සම්බන්ධ වූවක් නිසාම එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දීමක් ලෙස 3 වන ඡේදයේ සඳහන් විධිවිධාන වටහා නොගත යුතුය.

26 වැනි වගන්තිය
රාජ්‍යතාන්ත්‍රික දූත සේවා හෝ කොන්සල් තනතුරු දරන සාමාජිකයින්

ජාත්‍යන්තර නීතියේ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්ත්‍රික දූත සේවා හෝ කොන්සල් තනතුරු දරන සාමාජිකයන්ගේ මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම ගිවිසුමේ කිසිවක් බලනොපෑ යුතුය.

27 වැනි වගන්තිය
ප්‍රතිලාභ සඳහා වන හිමිකම

1. ගිවිසුමේ අනෙකුත් විධිවිධානවල කුමක් සඳහන් වුවද මෙම ගිවිසුම යටතේ අදාළ ආදායම් අයිතමයන් මත වන ප්‍රතිලාභ, එකී ප්‍රතිලාභය ලබා ගැනීම, ඕනෑම සැකැස්මකින් හෝ ගනුදෙනුවකින් අපේක්ෂා කරන ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් හෝ එකී ප්‍රතිලාභය මගින් ඍජුව හෝ වක්‍රව ලැබෙන්නේ නම් ද, මෙම වාතාවරණයන් මත එහි ප්‍රතිලාභය ප්‍රදානය කිරීම මෙම ගිවිසුමේ අදාළ විධිවිධානයන් හි අභිමතාර්ථයට සහ කාර්යයන් සමග අනුකූල වන්නේ යැයි ස්ථාපනය කර ඇත්නම්, අදාළ සියලු කරුණු සහ වාතාවරණයන් සැලකිල්ලට ගෙන එලෙස නියම කිරීම සාධාරණ වන්නේ නම් පමණක් මිස මෙම ගිවිසුම යටතේ ප්‍රතිලාභයන් ප්‍රදානය නොකළ යුතුය.

2. 1 වන ඡේදයේ විධිවිධාන යටතේ යම් පුද්ගලයෙකුට මෙම ගිවිසුම යටතේ වන ප්‍රතිලාභ ප්‍රතික්ෂේප වන අවස්ථාවක දී ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි අධිකාරිය විසින් එකී පුද්ගලයාගේ ඉල්ලීමක් සහ අදාළ කරුණු සහ තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගෙන, එකී පුද්ගලයා මෙම ප්‍රතිලාභයට හෝ විශේෂ ආදායම් අයිතමයකට සම්බන්ධව වෙනස් වූ ප්‍රතිලාභ හිමිකම් ඇති අයෙකු ලෙස සලකා, එකී ගනුදෙනු හෝ සැකසුම් නොමැති විටක, එවැනි ප්‍රතිලාභ එම පුද්ගලයාට ප්‍රදානය කරනු ලබන ආකාරයට, මෙම ප්‍රතිලාභ එම පුද්ගලයාට ප්‍රදානය කිරීමට එකී නිසි අධිකාරියට හැකියාව පවතී. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු මෙම ඡේදය යටතේ ඉල්ලීමක් කර ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි අධිකාරිය විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට පෙර එකී අනෙක් රාජ්‍යයේ නිසි අධිකාරිත්වයෙන් විමසා සිටිය යුතුය.

3. මෙම ගිවිසුමේ විධිවිධාන ගිවිසුම්කාර රාජ්‍යය දෙකින් කුමන හෝ රටක මූල්‍යමය මඟහැරීම සහ පැහැර හැරීම වැලැක්වීම උදෙසා අරමුණු කරගත් දේශීය නීතින්ගේ විධිවිධානයන් අදාළ කරගැනීම සඳහා බාධාවක් නොවේ.

28 වැනි වගන්තිය
බලාත්මක වීම

1. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ස්වකීය දේශීය නීතිය මගින් අවශ්‍ය කෙරෙන කාර්ය පටිපාටි සම්පූර්ණ කර ඇති බව එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් රාජ්‍යතාන්ත්‍රික මාර්ගයන් හරහා අනෙක් රාජ්‍යයට දන්වා සිටිය යුතුය. මෙම දැනුම්දීම අතුරින් පසුව කෙරෙන දැනුම්දීමේ දින සිට මෙම ගිවිසුම බලාත්මක විය යුතුය.

(අ) ප්‍රභවයේදී රඳවාගත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන දිනයට පසුව ඉක්බිතිව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ගෙවූ හෝ බැර කරන මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන්, සහ

(ආ) ආදායම් මත වෙනත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක දිනයට පසුව ඉක්බිතිවම එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු වර්ෂයක් සම්බන්ධයෙන්,

බලපැවැත්විය යුතුය.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙකොස්ලොවැක් ජනරජයේ ආණ්ඩුව අතර ආදායම සහ දේපළ මත බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මගහැරීම වැළැක්වීම සඳහා 1978 ජූලි මස 26 වන දින කොළඹ දී අත්සන් කළ සම්මුතිය, චෙක් ජනරජය හා ශ්‍රී ලංකාව සම්බන්ධ මෙම ගිවිසුම බලාත්මක වන දිනයේ සිට අවලංගු විය යුතුය.

29 වැනි වගන්තිය
අවසන් කිරීම

ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම බලපැවැත්විය යුතු වේ. ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වසර පහක කාලපරිච්ඡේදයකින් පසුව එළඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන්වීමට අවම වශයෙන් මාස හයකට පෙර රාජ්‍යතාන්ත්‍රික මාර්ග හරහා අවසන් කිරීම පිළිබඳ නිවේදනයක් මගින් කවර හෝ ගිවිසුම්කාර රාජ්‍යයකට මෙම ගිවිසුම අවසන් කළ හැකිය.

එවැනි අවස්ථාවක දී :

(අ) ප්‍රභවයේදී රඳවාගත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් පසුව ඉක්බිතිව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වන දින හෝ ඉන්පසුව ගෙවිය යුතු හෝ බැර විය යුතු ප්‍රමාණයන් මත;

(ආ) ආදායම මත වෙනත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් පසුව ඉක්බිතව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන ඕනෑම බදු වර්ෂයක ආදායම සඳහා;

මෙම ගිවිසුම බලපැවැත්වීම අවසන් වන්නේය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත සඳහන් කරන අය මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත පාඨයන්ගෙන් යුක්ත සිංහල, චෙක් සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුල් පිටපත් දෙකකින් යුතුව වර්ෂ 2023 පෙබරවාරි මස 03 දින කොළඹ දී අත්සන් තබන ලදී. අර්ථ නිරූපනයේදී ප්‍රතිවිරුද්ධතාවක් ඇති වුවහොත් ඉංග්‍රීසි පාඨය බල පැවැත්විය යුතුය.

....
කනකරත්න මුදියන්සේලාගේ මහින්ද සිරිවර්ධන
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්.

....
ආචාර්ය එලිස්කා සිගෝවා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ පූර්ණාධිකාරීධර සුවිශේෂ චෙක් තානාපති
චෙක් ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්.

EOG - 11 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.